**පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ (ව්‍යා.ක්‍රි.ඒ.) 2010 මාර්තු 31 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

1. **මතය.**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක තැන්පතුව සහ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් ව්‍යාපෘතිය විසින් පවතවා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතිවන්ලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන.**

-------------------

2.1 **මූල්‍ය කාර්යය සාධනය.**

------------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ- ඌව පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ (ව්‍යා.ක්‍රි.ඒ.) 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම රු.656,517,564 ක් විය. 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2010 මාර්තු 31 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| සිවිල් වැඩ | 625,069,513 |
| ලී බඩු හා සවි කිරීම් | 1,146,294 |
| කාර්යාලයීය උපකරණ | 2,070,197 |
| උපදේශක සේවා | 5,031,215 |
| වර්ධක හා මෙහෙයුම් පිරිවැය | 23,200,345 |
| එකතුව | 656,517,564 |

2.2 **විශේෂ ඩොලර් ගිණුම්.**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ඌව පළාත, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - නැගෙනහිර පළාත හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - උතුරු පළාත සඳහා වෙන් වශයෙන් විශේෂ (ඩොලර්) ගිණුම් 4 ක් විවෘත කර තිබුණි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඌව පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| ලැබුණු ආරම්භක අත්තිකාරම | 13,716,776 | 1,541,141,509 |
| එකතු කළා | | |
| ඌන පූරණය කිරීම් | නැත | නැත |
| | 13,716,776 | 1,541,141,509 |
| අඩු කළා | | |
| ආපසු ගැනීම් (විදේශාධාර) | 6,075,872 | 677,396,183 |
| විදේශ විනිමය පාඩුව | -- | 15,964,081 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 7,640,904 | 847,781,245 |

## 3. විගණන නිරීක්ෂණ.

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

ව්‍යාපෘතිය යටතේ ඌව පළාතේ පළාත් මාර්ග සංවර්ධනය සඳහා වූ ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව, මාර්ග 22 ක කිලෝ මීටර් 330 ක් සංවර්ධනය කිරීම සඳහා හඳුනා ගෙන තිබුණි. එයින් එකතුව රු.3,951,698,957 ක් වූ කොන්ත්‍රාත්තු 5 ක් මාර්ග කිලෝ මීටර් 109.93 ක් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා 2010 නොවැම්බර් මාසයේ දී ප්‍රදානය කර තිබුණි. 2011 මැයි 10 දින සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව එක් එක් කොන්ත්‍රාත්තුවේ භෞතික කාර්යය සාධනය ඉලක්කයට වඩා පිටුපසින් විය. මේ සම්බන්ධයෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2011 ජුනි 27 දින විගණනයට මෙසේ පිළිතුරු සපයා තිබුණි. ***"කාල පරිච්ඡේදය තුළ රට පුරා අසාමාන්‍ය කාලගුණ තත්ත්වයක් ඇති විය. ධාරාණිපාත වර්ෂාව හා ප්‍රවේශ මාර්ගවලට හා ව්‍යාපෘති මාර්ගවලට සිදු වූ නොසිතූ විරූ නාය යෑම් හේතුවෙන්, ඌව පළාත බරපතල බලපෑමකට ලක් වී තිබුණි. එබැවින්, සැලසුම් කළ පරිදි භෞතික කාර්යයන් සිදු කිරීමට නොහැකි විය."*** යනුවෙනි.

### 3.2 උපදේශකවරුන් පත් කිරීම.

-------------------------------

ඌව පළාතේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තු 5 ක් අධීක්ෂණය කිරීමේ කොන්ත්‍රාත්තුව 2010 සැප්තැම්බර් 16 දින රු. මිලියන 516 ක කොන්ත්‍රාත් මුදලකට විදේශීය උපදේශක සමාගමකට ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව මෙම කාර්යය සඳහා ඉහළම තනතුරු වර්ග 11 ක් යටතේ මිනිස් මාස 1710 ක් යෙදිය යුතුව තිබුණි. උපදේශක සමාගමට රු. මිලියන 6 ක මුදලක් ගෙවා තිබුණ ද, ඔවුන්ගේ ශ්‍රම බලකාය යෙදවීම පිළිබඳ විස්තර විගණනය සඳහා ලැබී නොතිබුණි.